# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 70 — 1973 ජූලි 27 වැනි සිකුරාදා — 1973.07.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පලකිරීම්


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 941 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 948 |
| නිරස්ත කළ වෙළෙඳ නාම පිළිබඳ දැන්වීම් ... ... | 947 | රට සීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බෑංකිරාදිය විකිණීම ... ... ... | 947 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 949 |
| තොටුපල් රේන්ද සහ වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 950 |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

[සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරණ ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්‍ෂණ පනත, 1973 ජූලි 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.]

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1973. 08. 1 සිට 1974. 7. 31 දක්වා මෙරට සෑදූ අනුපිටපත් කිරීමේ තීන්ත සැපයීම ... | 1973. 08. 24 |
| 2. 1973. 08. 1 සිට 73. 12. 31 දක්වා මෙරට සෑදූ පිත්තල සහ යකඩ ඉස්කුරුප්පු ඇණ සැපයීම ... | 1973. 08. 21 |

අනුපිටපත් කිරීමේ තීන්ත සැපයීම සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ 363 දරණ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් තමන්ගේ සැම්පල් පරීක්‍ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතික පත්‍ර ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කල යුතුය.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්‍ෂ.

1973 ජූලි මස 27 වන දින,
කොළඹ දී ය.

7-974 —73.07.27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයන් පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා අහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

---

## වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය

**ටෙන්ඩර් දැන්වීම් අංක : 5/73**

දුව සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

1973.09.01 සිට 1974.08.31 දක්වා වූ දොළොස් මසක කාලයක් තුල වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයට කොස්, දෙල්, හොර, හල් මිල්ල හා බුරුත කඳන් සැපයීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1973.08.20 වෙනිදා ප. ව. 2.30 දක්වා වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයේ ඉංජිනේරු කළමනාකරු විසින් භාරගනු ලැබේ.

වැඩි විස්තර හා අදාල ටෙන්ඩර් පෝරම පාලන ලේකම්, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, කොළඹ 1 හෝ මිලයට ගැනීමේ නිලධාරි වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය, ඉංජිනේරු කොට්ඨාශය, කොච්චිකඩේ, කොළඹ 13 වෙතින් ලබාගත හැක.

ඉංජිනේරු කළමනාකරු.

7-1016—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් දැන්වීමයි

**ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය**

**උඩවලවේ ව්‍යාපාරයේ ගොවිකම් පර්යේෂණ හා ව්‍යාප්ති මධ්‍යස්ථාන යට අවශ්‍ය රසායන ද්‍රව්‍ය සැපයීම**

ටෙන්ඩර් අංක : එච්

**ටෙන්ඩර් අවසාන දිනය : 1974 ජනවාරි මස 03 වෙනි දින**

1. උඩවලවේ යෝජනා ක්‍රමයේ ඉහත සඳහන් ස්ථානයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය සැපයීම සහ භාරදීම සඳහා ලංකාවේ, කොළඹ 7, බෞද්ධ ලෝක මාවතේ අංක 415, දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1974 ජනවාරි මස 03 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 තෙක්, ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම සැපයීම ලබා ගැනීම සඳහා මුදල් යොදවනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත්වල ණය මුදලින් බැවින්, ලබාගත යුතු යෝග්‍ය ස්ථානවල සැපයුම් කරුවන්ගෙන් සහ ඔවුන් වෙනුවෙන් පමණක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

3. විශේෂ අරමුදල් සම්පත් වලින් සැපයීම් ලබා ගන්නේ පහත සඳහන් යෝග්‍ය ස්ථාන වලිනි. ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, කැනඩාව, ඩෙන්මාර්කය, ජර්මන් සමූහාණ්ඩුව, ෆින්ලන්තය, ජපානය, නෙදර්ලන්තය, එක්සත් රාජ්‍යය සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් සංවර්ධනය වන සාමාජික රටවල් :— (අප්ඝනිස්ථානය, බන්ගලා දේශය, හොංකොං, ඉන්දියාව, ඉන්දුනීසියාව, කෝමර් සමූහාණ්ඩුව, දකුණු කොරියන් සමූහාණ්ඩුව, ලාඕස්, මැලේසියාව, නේපාලය, පකිස්ථානය, චීන සමූහාණ්ඩුව, (තායිවානය) ෆීජී, පිලිප්පීනය, සිංගප්පූරුව, තායිලන්තය, ටොන්ගාව, බටහිර සමෝවාව, පපුවා සහ නිව් ගිනියා දේශ සීමාව, වියට්නාම සමූහාණ්ඩුව, (සයිගොන්).

4. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් ලියකියවිලි කොළඹ 7, බෞද්ධ ලෝක මාවතේ අංක 415, දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම්ගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

5. ටෙන්ඩර් ලියකියවිලි පහත සඳහන් තානාපති කාර්යාල වලින් ද ලබා ගත හැක :—

(අ) ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ආ) කැනඩාවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ඇ) ඩෙන්මාර්කයේ සිටින ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් තුමා
(ඈ) ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා, බෙල්ජියම සහ නෙදර්ලන්තය
(ඉ) ෆින්ලන්තයේ සිටින අති ගරු ශ්‍රී ලංකා තානාපති තුමා
(ඊ) ජපානයේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(උ) එක්සත් රාජධානියේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ඌ) ඉන්දියාවේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(එ) ඉන්දියාවේ බොම්බායේ සිටින ගරු වෙළඳ කොමසාරිස් තුමා
(ඒ) ඉන්දුනීසියාවේ සිටින අති ගරු ශ්‍රී ලංකා තානාපති තුමා
(ඔ) සියුල්හි කොරියන් සමූහාණ්ඩුවේ සිටින ආර්ථික සහයෝගතා පිළිබඳ අධ්‍යක්ෂතුමා
(ඕ) මලයාසියාවේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ක) බටහිර පකිස්ථානයේ සිටින ශ්‍රී ලංකාවේ වෙළඳ කොමසාරිස් තුමා
(කා) ශ්‍රී ලංකා තානාපති තුමා, මැනිලා, පිලිපයින්ස්
(කැ) ගරු වෙළඳ කොමසාරිස් තුමා, සිංගප්පූරුව
(කෑ) සංවර්ධන අධ්‍යක්ෂ ජාත්‍යන්තර සහයෝගතා සහ සංවර්ධන මණ්ඩලයේ මුදල් අංශය, ටයිපෙයි, චීන සමූහාණ්ඩුව
(කි) තායිලන්තයේ ලංකා නියෝජිත තානාපති තුමා
(කී) විදේශ අමාත්‍යාංශය, සයිගොන්, වියට්නාමය
(කු) ලංකා තානාපති තුමා, බුරුමය.

යෝග්‍ය ස්ථානවල ප්‍රධානීන් වෙනුවෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන මෙරට නියෝජිතයින් විසින් ටෙන්ඩර් ලියකියවිලි කට්ටලයක් වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු. 250 ටෙන්ඩර් තැන්පත් මුදලක් ද, අවලංගු කරන ලද මින් එක් එක් කට්ටලයක් වෙනුවෙන් රු. 10 ක ගාස්තුවක් ද, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරිට මුදලින් ගෙවිය යුතුය.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

1973 ජූලි 27 වෙනි දින,
තැ. පෙ. 524,
කොළඹ 7.

7-1018—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

ටෙන්ඩර් දැන්වීමයි

පහත දැක්වෙන ප්‍රවාහන සේවාවන් සඳහන් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

1. කොළඹ සහ ත්‍රිකුණාමල වරායවල සිට වාලච්චේනය දක්වා නැව් බඩු ප්‍රවාහනය කිරීම.
2. කොළඹ සිට වාලච්චේනය දක්වා ඉවතලන කඩදාසි යනාදිය ප්‍රවාහනය කිරීම.

1973.08.07 වෙනි දින ප. ව. 2 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත් සහ වෙනත් විස්තර ලිඛිතව අයදුම් කිරීමෙන් ලබාගත හැක.

වැ. බ. සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යුනියන් පෙදෙස,
කොළඹ 2.

7-1008—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

ටෙන්ඩර් දැන්වීමයි

1974 වර්ෂයට අවශ්‍ය මුද්‍රිත පෝර්ම සහ රෙජිස්තර මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ, අංක 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1973 අගෝස්තු මස 29 වෙනිදා පෙරවරු 10 වනු තෙක් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. මෙම පෝර්ම පත් වේරහැර, බොරලැස්ගමුවේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරී තැන ගේ කාර්යාලයෙන් 1973 අගෝස්තු මස 28 වෙනි දින දවල් 12 වනතෙක් ලබාගත හැකිය. පෝර්ම පත් ලබා ගැනීමට වේරහැර, බොරලැස්ගමුවේ ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා ගාස්තු වශයෙන් රු. 10ක මුදලක්ද, මෙයට අමතරව අය කරනු ලැබේ.

වැඩි විස්තර මේම කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

සම්පාදක කොට්ඨාශය,
වේරහැර,
බොරලැස්ගමුව.

7-1015—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

**තුත්තනාගම් සුන්බුන්, පිත්තල හෝ ඇල්මිනියම් සිලින්ඩර සහ පී. වී. සී. ත්‍රිත්ව සංදාම**

පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා කොළඹ 1, ලෝටස් පාරේ, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ, 5 වෙනි මහලේ, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ගැණුම් පත් මණ්ඩලයේ සභාපති විසින් 1973 අගෝස්තු මස 22 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| | | ටොන් |
|---|---|---|
| (අ) තුත්තනාගම් සුන්බුන් (පිරිසිදුතාවය 99% විය යුතුයි) | | 2 |
| (ආ) සිලින්ඩර (පිත්තල හෝ ඇලිමිනියම්) | ... | 500 |

(i) අදාළ සැලසුම මෙම කායඪාලයෙන් ලබාගත හැක.

(ii) මිළ ගණන් දෙවර්ගයට වෙන වෙනම ඉදිරිපත් කළ යුතුයි.

| | | ශාර් |
|---|---|---|
| (ඇ) පී. වී. සී. ත්‍රිත්ව සංදාම | ... ... | 30,000 |

2. කොළඹ 1, ලෝටස් පාරේ, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ 5 වෙනි මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් පෝරම පිටපත් දෙකකින් යුක්තව, ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් කාර්යාලයේ දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමටද, අවශ්‍ය විස්තර දැන ගැනීමටද පුළුවන.

3. කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කාර්යාලයේ කැෂියර් වෙත හෝ තැපැල් කායඪාලයක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය, ඉහත කී ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 අගෝස්තු මස 17 දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවනට ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

එච්. ඞී. එස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය,
5 වෙනි මහල,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර,
කොළඹ 1.

7-975—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කෑගල්ල දිස්ත්‍රික්කයේ, පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973 අගෝස්තු මස 10 වන දින පස්වරු 2.30 දක්වා කොළඹ. තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

| වැඩෙහි නම සහ ස්වභාවය | | ලියා පදිංචි විය යුතු මුදල |
|---|---|---|
| 1. පන්දෙනිය ජනපද පාර තැනීම | ... | රු: 75,000 00 |
| 2. බටගේන්කන්ද ජනපද පාරේ 2 වන සැතැප්ම තැනීම | ... | රු: 75,000 00 |
| 3. මැදිකැලේ ජනපද පාර තැනීම | ... | රු: 50,000 00 |
| 4. කිරිංගල ජනපද පාර තැනීම | ... | රු: 40,000 00 |
| 5. ගැටබේරියගල් බොක්ක ජනපද පාර තැනීම | ... | රු: 40,000 00 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනටද, සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලටද, මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැක. ටෙන්ඩර් පත්‍ර 1973 අගෝස්තු මස 08 වන දින දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

3. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ ඉඩම් කොමසාරිස් කායඪාලයේ හෝ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු: 100ක් තැන්පත්කර ඒ වෙනුවෙන් ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක. ටෙන්ඩර් පත්‍ර පිටපත් 2කින් යුතුව එවිය යුතු අතර, එසේ එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ උඩ වම් කෙලවරයෙහි වැඩෙහි නම සඳහන් කර ලියා පදිංචි කල තැපැලෙන් කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුවේ. නැතහොත්, ගාලු මුවදොර මහා ලේකම් කායඪාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කල යුතුයි. කෑගල්ල කච්චේරියෙන් ලබා ගන්නා ටෙන්ඩර් පත්‍ර හැර වෙනත් ටෙන්ඩර් පත්‍රවල ඉදිරිපත් කරන ටෙන්ඩර් සහ ටෙන්ඩර් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසිවලට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. 1973 අගෝස්තු මස 10 වන දින පස්වරු 2.30ට ඉහතකී අංක 320 දරන කාමරයෙහි ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

5. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුලු මුදලින් 5% ක මුදලක් ඇප මුදල් වශයෙන් තැන්පත් කල යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් බවට දැන්වීමක් ලැබීමෙන් පසු දින 7ක් ඇතුලත දී ගිවිසුම් පත්‍රයකට අත්සන් කිරීමට සූදානම් විය යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ලියවිල්ලක් ඔහු වෙත පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් සපයා ඇති ලිපිනයට ලියා පදිංචි කල තැපැලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බැව් දැන්වූ බැව් පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසු ගිවිසුම් පත්‍රය අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කලහොත් හෝ අතපසුකලහොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වන අතර, ඔහු ගිවිසුම් කඩකල කොන්ත්‍රාත්කරුවකු ලෙස පිළිගැනෙනවා ඇත.

6. කිසිම හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් හෝ භාර ගැනීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය තිබේ.

7. කෑගල්ල දිසාපතිගේ ලිඛිත අවසරය නොමැතිව වැඩ ගිවිසුම් පත්‍රය වෙනත් අයෙකුට පැවරීමට හෝ භාර දීමට නුපුලුවන. එසේම තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු වැඩය කෙරෙන ප්‍රදේශයෙන් අවශ්‍යතාවයන් අනුව පුහුණු හා නුපුහුණු ලාංකික කම්කරුවන් සේවය සඳහා යෙදවිය යුතුය.

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය නම් කෑගල්ලේ කච්චේරියේ ඉඩම් ශාඛාවෙන් ලබාගත හැක.

කේ. පතිරණ විමලධම්,
කෑගල්ල දිස්ත්‍රික්කයේ, දිසාපති.

1973 ජූලි මස 12 වන දින,
කෑගල්ල කච්චේරියේ දීය.

7-970—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### ✓ටෙන්ඩර් දැන්වීම්

**ලංකා ගමනාගමන මණ්ඩලය**

කොළඹ 5, 200 කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපතිතුමා විසින් පහත සඳහන් වැඩය සඳහා 1973 අගෝස්තු මස 15 වෙනි දින පෙ. ව. 10 වන තෙක් සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | කොන්ත්‍රාත්කරුගේ අවම ලියා පදිංචි සීමාව |
|---|---|
| 1. නිට්ටඹුව ඩිපෝවේ ගැලුම් 5000 හේ වතුර ටැංකියක් තැනීම— ඉසී/549 | රු. 25,000 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාළ සැලසුම් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. ලංගම, රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100ක්ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක්ද ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත 1973 අගෝස්තු මස 14 වෙනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා එම කුවිතාන්සි මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යතාර්ථය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍ර. ගි. නි. තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණී.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
කොළඹ 5.

7-1009—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

යාපනය දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති, මහා ලේකම් කාර්යාලය, යාපනය, විසින් 1973.08.27 දින ප. ව. 2.00 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රු. ශ. |
|---|---|
| (i) යාපනය දිස්ත්‍රික්කයේ කරාච්චි ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පිහිටා ඇති කිලිනොච්චි ඉඩම් කාර්යාලයේ විදුලි වතුර පොම්පයක් සවි කිරීම ... | 4,000 0 |
| (ii) යාපනය දිස්ත්‍රික්කයේ කරාච්චි ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ කිලිනොච්චි ඉඩම් කාර්යාලයේ වතුර පොම්ප කාමරයක් තැනීම ... | 1,000 0 |
| (iii) යාපනය දිස්ත්‍රික්කයේ තුණුක්කායි ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පිහිටා ඇති වවුනිකුලම් VI වැනි කොට්ඨාශයේ ඉඩම් කට්ටි ඕවර් සියර් වරයාගේ නිවාසය අළුත්වැඩියා කිරීම ... | 1,500 0 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට මහා මාර්ග, වාරි මාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට සහ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ටද 1973 අගෝස්තු මස 24 වැනි දින පස්වරු 1.30 දක්වා යාපනය කච්චේරියේ ඉඩම් ශාඛාවේදී ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. කොන්ත්‍රාත්තුව බලාපොරොත්තු වන අය තමන් එසේ ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි යාපනය දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3. එක් එක් ටෙන්ඩර් වෙනුවෙන් රු. 25 ක තැන්පත් මුදලක් ගෙවූ බවට වූ කුවිතාන්සියක් ඉදිරිපත් කොට යාපනය දිසාපතිගෙන් ලබා ගත හැකි ආකෘතිවල දෙපිටපතකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් තැන්පත් මුදල මේ දැන්වීම පලකරනු ලැබීමෙන් පසු තැන්පත් කල යුතු අතර, එම තැන්පත්තුවට සාක්ෂි වශයෙන් ලබාගන්නා ලද කුවිතාන්සිය ටෙන්ඩරයට ඇමිණිය යුතුය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පතුවෙනුත් ඇප තැන්පතුවෙනුත් නිදහස් ය. එසේ වුවද, ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබෙන්නේ ඉහත සඳහන් ලියාපදිංචිය ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර් පත් යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය ආවරණය කරන කවරය මුද්‍රා තැබිය යුතු අතර, එහි වම් පස උඩ කෙළවරේ වැඩයේ නම සඳහන් කළ යුතුය. ටෙන්ඩරය ලියාපදිංචි තැපෑලෙන් නොඑවනු ලැබේ නම් එය යාපනය මහ ලේකම් කාර්යාලයේ කාර්යාල සහකාරගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව නියමිත දිනයට පෙර පැමිණ තැන්පත් කළ හැකිය.

5. පළමුවෙනි ඡේදයේ දැක්වෙන වේලාවට පසු ලැබෙන ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසානවූ විට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය.

7. ටෙන්ඩරය බාරගන්නා ලද බව ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබ දින 10 ක් ඇතුලත යම් කෙනෙකු ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළොත් හෝ අත්සන් කිරීමට අසමත් වුවහොත් එසේ නැතහොත් අනුමත කරන ලද ඇප මුදල බැඳීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පතුව රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවීමේදී සේවයට ගත යුත්තේ පුහුණු හා නුපුහුණු ලාංකික කම්කරුවන් පමණක් වන අතර, හැකිතාක් දුරට එම කම්කරුවන් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම බඳවා ගත යුතුය.

9. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුට ගිවිසුමක් අත්සන් කිරීමටත්, ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5 ක් ඇප වශයෙන් යාපනය දිසාපති වෙත තැන්පත් කිරීමටත්, එම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුලත වැඩ අවසන් කර බාරදීමටත් නියම වනු ඇත.

10. වැඩ පිළිබඳ වෙනත් අවශ්‍ය විස්තර ඇතොත් යාපනය දිසාපතිගෙන් ලබා ගත හැකිය.

11. පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ නම් සඳහන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

12. ප්‍රශ්නයෙන් තොරව, කිසියම් ටෙන්ඩරයක් හෝ සියලු ටෙන්ඩර හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ භාර ගැනීමේ අයිතිය දිසාපති තබා ගනී.

13. ටෙන්ඩර්කරුවන් තමන් ඉදිරිපත් කරන ගණන්, ටෙන්ඩර් විවෘත කරනු ලබන දිනයේ සිට මාසයක් විවෘතව තැබිය යුතුය.

පී. මුරුගේසපිල්ලෙයි,
උප දිසාපති,
යාපනය දිසාපති වෙනුවට.

1973 ජූලි මස 13 වෙනි දින,
ඉඩම් ශාඛාව, කච්චේරිය,
යාපනය.

7-980 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## කච්චේරිය මහනුවර

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973.08.17 දින පෙරවරු 10 දක්වා මහනුවර දිසාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

1. යෝජිත ගුරුළුපොත නානායම තැනීම.

2. මෙම වැඩ සඳහා 1973. 08. 10 වෙනි දින දහවල් 12තෙක් මහනුවර කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් ෆෝර්ම්, ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැකිය. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති, සහ සමූපකාර සමිතිවලටද රජයේ දෙපාර්තමේන්තුවල රු. 35,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද පමණක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින් ඉහත සඳහන් වැඩ වෙනුවෙන් රු. 100ක මුදලක් මහනුවර කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති, සහ සමූපකාර සමිති ටෙන්ඩර් ෆෝර්ම සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණකර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයේ මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් පස උඩ කෙළවරේ වැඩයේ නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම ලේඛනගත තැපෑලෙන් නොඑවන්නේ නම්, මහනුවර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහාලිය හැකිය.

5. 1973. 08. 17 වෙනි දින පෙරවරු 10 ට මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එනම් 1973. 08. 17 වෙනි දින පෙරවරු 10 ට සියළුම ටෙන්ඩර් කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

7. සතුටුදායක ටෙන්ඩර්කරුවන් හට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් (5%) සියයට පහක් සතුටුදායක ලෙස නිම කිරීමට ඇප වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදායක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නො ලැබේ. සතුටුදායක ටෙන්ඩර්කරුවන් හට මෙසේ දැනුම්දී දින 7 ක් ගෙවීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත්වුවහොත් ඔහුගේ තැන්පත් මුදල වන රු. 100 රාජසන්තක කරනු ලැබේ.

ඇස්. මාරලන්ද,
මහනුවර දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

කච්චේරිය,
මහනුවර,
1973. 07. 09 දින දීය.

**7-968 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය**

### අධ්‍යාපන අමාත්‍යාංශය

1973 වර්ෂය සඳහා සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම

රජයේ පාසල්වලට අවශ්‍ය සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1973 අගෝස්තු මස 17 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එතැන පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 වැනි ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන අමාත්‍යාංශ කායාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1973 අගෝස්තු මස 16 වැනි දින පස්වරු 3.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කායාලයේදී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර පත්‍ර බහා එවන කවරයෙහි වම් පස මුදුන් කෙළවරේ "සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම—1973 වර්ෂය සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර පත්‍රය" යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩර පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරයි මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩර් මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන අමාත්‍යාංශයේ කායාල සහකාර වෙත භාර දීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනය ද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය).

6. ටෙන්ඩර ආකෘති පත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර තැන්පත් වශයෙන් රුපියල් 100 ක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට ටෙන්ඩර්කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි ද දැනගත හැකිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 16 දින
කොළඹ 2 මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී.

7-966 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රසායන ද්‍රව්‍ය (දැනට ඇති තොගවලින්) සැපයීම සඳහා 1973.08.16 දින පෙ. ව. 10 වනතෙක් ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැක.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය: 3/1—(4/36).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973.07.16.

7-956—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මොරටුවේ මෝස්තර මධ්‍යස්ථානයේ පාවිච්චිය සඳහා ඇට, කඳන්, සම්, මැටි, වැලි ආදිය වැනි විවිධ වර්ගයේ අමු ද්‍රව්‍ය සැපයීම සඳහා දේශීය සැපයුම්කරුවන්ගෙන් 1973. 08. 15 දින පෙ. ව. 10 වනතෙක් ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. සියලු විස්තර හා ටෙන්ඩර් කොන්දේසි සඳහා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය: 3/1—(5/35).
1973. 07. 16 දින,
කොළඹ 1,
හේමාස් ගොඩනැගිල්ලේ,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දීය.

7-957 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

කන්කසන්තුරේ ගුවන් තොටුපල ආපන ශාලාව

1973 ඔක්තෝබර් 01 වැනි දින සිට එක් වසරක කාල සීමාවක් තුළ කන්කසන්තුරේ ගුවන් තොටුපල පාලන ගොඩනැගිල්ලේදී ගුවන් මගීන්ට, අමුත්තන්ට සහ සේවක මණ්ඩලයට කෑම සහ ආහාරපාන සැපයීමේ සහ අලෙවිකිරීමේ වරප්‍රසාදය ලබා දීම සඳහා 1973. 08. 15 වැනි දින පෙ. ව. 10 තෙක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් ලාංකිකයින් විය යුතු වන අතර, ඔවුන් ආහාර පාන සැපයීමේ ව්‍යාපාරයෙහි යෙදී යටත් පිරිසෙයින් පස් වසරක පළපුරුද්දක් ලබා තිබීම සහ/හෝ සතුටුදායක තත්ත්වයකින් ආපන ශාලාව පවත්වාගෙන යාමට තමන් සතු සම්පත් සහ හැකියාව පිළිබඳව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ සෑහීමට පත් කිරීමට හැකි තත්ත්වයක සිටීම අවශ්‍යය.

73. 08. 10 වැනි දින දහවල් 12 දක්වා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ කාර්යාලයේදී හෝ කන්කසන්තුරේ ගුවන් තොටුපල කොමඩාන්ට් තැනගේ කාර්යාලයේ දී නැතහොත් කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයකදී රුපියල් පණහක (රු. 50 ක) මුදලක් තැන්පත් කර ඒ බවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටදී මේ ආකෘති පත්‍ර ලබාගත හැක.

සී. ඩබ්ලිව්. ඇම්. අපොන්සෝ,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1973. 07. 16 දින,
කොළඹ 1,
තැ. පෙ. 535,
සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ දීය.

7-906 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව—හම්බන්තොට කච්චේරිය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙහි පහත දැක්වෙන තැනීම් වැඩ සඳහා 1973.08.17 වැනි දින පස්වරු 2 දක්වා කොළඹ තැපැල් පෙට්ටිය අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වැඩයේ නම | ලියා පදිංචි වියයුතු මුදල රු. ශ. |
|---|---|
| 1. මුරුතවෙල ව්‍යාපාරයේ ව්රැක් 2 (ව්රැක් 3 හරහා) ප්‍රවේශ මාර්ගයේ 2 වන සැතැපුම තැනීම ... ... | 31,538.75 |

2. ඉහත සඳහන් කර ඇති වැඩට ඉදිරියෙන් දක්වා ඇති මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා අනුමත කරන ලද සංගම්වලටද, 1973.08.10 දින පේරවරු 11 දක්වා හම්බන්තොට දිසාපති විසින් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ලියා පදිංචිය හා අනිකුත් දෑ සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් හම්බන්තොට කච්චේරියේ ඉහත දැක්වෙන වැඩය වෙනුවෙන් රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතාන්සියක් හම්බන්තොට දිසාපතිවෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම් හා තැපැල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයත් සමිති වලටද, එම වැඩ සඳහා ඉහත දැක්වෙන මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වී තිබේ නම් එකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකියි. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් කරනු ලැබේ. එහෙත් ඉහත වැඩය වෙනුවෙන් දක්වෙන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු එපමණක් එකී සමිතිවලට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්තව ලේඛණ ගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් ඉහළ කෙළවරේ වැඩ යෙහි නම ලියා තැබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නො එවන්නේ නම්, ගාලු මුවදෙර මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

5. 1973 අගෝස්තු මස 17 දින පස්වරු 2.30 ට ඉහතකී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලියවිල්ලකින් දන්වූ පසු දින 10 ක් ඇතුලත ගිවිසුම් පත්‍ර අත්සන් කිරීමට හා ඇප මුදල් තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

7. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩකරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයෙන්ම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවාගත යුත්තේ වැඩ කරනු ලබන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ජයග්‍රාහී ටෙන්ඩර්කරුට භාරදෙන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙන යන අතරතුරදී කොටස් මුදල් ලබාගැනීමට අවශ්‍ය වුවහොත් එවැනි අවස්ථාවලදී කරන ලද වැඩවල තක්සේරු කැරුන වටිනාකමින් සියයට 90 කට සරිලන ප්‍රමාණයේ කොටස් මුදල් ලබාගත හැකියි.

9. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් විස්තර ඇත්නම් හම්බන්තොට දිසාපතිගෙන් විමසීමෙන් ලබාගත හැකියි.

ඩබ්ලිව්. පී. එස්. ජයවර්ධන,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

1973 ජූලි මස 02 වන දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේදීය.

7-891 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය**

**ටෙන්ඩර් දැන්වීම අංක 4/73**

**පාවිච්චි කරන ලද දියත් යාත්‍රා විකිණීම**

පාවිච්චි කරන ලද පහත් සඳහන් දියත් යාත්‍රා විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩරපත් කොළඹ–1, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයේ, ඉංජිනේරු කළමනාකරු විසින් 1973 අගෝස්තු 10 වෙනි දින ප.ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

වැඩි විස්තර සහ ටෙන්ඩර් පෝර්ම පහත සඳහන් නිලධාරින්ගෙන් ලබාගත හැක.

(1) පාලන ලේකම්,
වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය,
ප්‍රධාන කාර්යාලය,
කොළඹ–1.

(2) මිළයට ගැනීමේ නිලධාරි,
වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය,
ඉංජිනේරු කොට්ඨාශය,
කොච්චිකඩේ,
කොළඹ–13.

| අංකය | යාත්‍රාවේ ස්වභාවය | නම හෝ හැඳින්වීමේ අංකය | මිණුම් ප්‍රමාණය දිග | පළල | ගැඹුර | බඳ |
|---|---|---|---|---|---|---|
| 1. | ටග් යාත්‍රාව (වාෂ්ප) ... ... | " රෝස් මේරි "—ටී. 11 ... ... | 65′–0″ | 17′–0″ ... | 9′–3″ | වානේ |
| 2 | එම ... ... ... | " ඩාබෙට "—ටී. 12 ... ... | 60′–9″ | 17′–0″ ... | 9′–0″ | වානේ |
| 3. | එම ... ... ... | " ඩයනා "—ටී. 13 ... ... | 60′–0″ | 17′–0″ ... | 9′–0″ | වානේ |
| 4. | එම ... ... ... | " පද්මිනී "—ටී. — ... | 60′–0″ | 15′–0″ ... | 6′–0″ | ලී |
| 5. | එම ... ... ... | " අම්බලම් "—ටී — ... | | | | |
| 6. | වතුර බත්තල් ... ... ... | " ලබුගම "—ඩබ්ලිව්. 23 ... ... | 70′–6″ | 21′–0″ ... | 8′–6″ | වානේ |
| 7. | මෝටර් ලෝන්ච් ... ... | " වෙන්ඩ "—ඇම්. ඇල්. 10 ... | 30′–6″ | 8′–1″ ... | 4′–4″ | ලී ඇන්ජිම රහිත |
| 8. | මෝටර් ලෝන්ච් ... ... | " සුභෝදනී "—ඇම්. ඇල්. 6 ... | 52′–0″ | 10′–6″ ... | 5′–8″ | ලී |
| 9. | හබල් බෝට්ටු ... ... | පී සහ ජී බෝට්ටු—පී. 146 ... ... | 19′–6″ | 11′–0″ ... | 8′–0″ | ලී |
| 10. | හබල් බෝට්ටු ... ... ... | පී සහ ජී බෝට්ටු—පී. 144 ... ... | 36′–10″ | 9′–6″ ... | 4′–6″ | ලී |
| 11. | හබල් බෝට්ටු ... ... ... | පී සහ ජී බෝට්ටු—පී. 98 ... ... | 26′–0″ | 7′–6″ ... | 3′–8″ | ලී |
| 12. | හබල් බෝට්ටු ... ... ... | පී සහ ජී බෝට්ටු—පී. 12 ... ... | 36′–9″ | 6′–6″ ... | 4′–6″ | ලී |

ඉංජිනේරු කළමනාකරු.

7–1017—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

**සුරාබදු දෙපාර්තමේන්තුව**

ගල්ඕල්ල ප්‍රවාහන පීප්ප සැපයීම සඳහා වූ ටෙන්ඩරය 1973-ප්‍රතිඵල

(අ) ලත් ටෙන්ඩර් ගණන : 3.

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය : බී. එල්. එම්. මැන්දිස් මහතා, නො. 7, කටුකුරුන්ද, මොරටුව.

(ඉ) පිළිගත් මිළ ගණන : පීප්පයකට රු. 298 බැගින්.

හේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්

1973.07.10 වන දින,
කොළඹ දී ය.

7-859 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

දැව වෙන්දේසිය—බටහිර දිසාව

තොග 13 කින් යුත් පෙලෙන්, හොර, ආරිද්ද, හැඩවක, මිල්ල, අළුබෝ, මලබඩ, හොර, දවට, කොකුම්, දෙල්, කීන, දුන් සහ ලියන් කඳන් ඝන අඩි 1213.8 ක් සහ එක් තොගයකින් යුත් පිහියා 1 ක් ද, කැති දෙකක් සහ දැලි තුල් 3 ක් ද, රත්නපුර දිසා වන නිලධාරි විසින් 1973 අගෝස්තු 10 දින පෙරවරු 10 ට අගලවත්ත අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනවා ඇත.

වෙන්දේසියට ප්‍රථම මෙම දැව සහ භාණ්ඩ බලා සැහීමකට පත් වන ලෙස ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම දැව අගලවත්ත අඩවි වන නිලධාරි කොට්ඨාශයේ ඇත.

වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර බස්නාහිර දිසා වන නිලධාරි ගෙන් හෝ අගලවත්ත අඩවි වන නිලධාරියෙන් ලබාගත හැකිය.

එච්. ආර්. පීරිස්,
දිසාවන නිලධාරි—බටහිර දිසාව.

රත්නපුර.

7-979 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රසිද්ධ වෙන්දේසියක්**

කෝපායි එළිමහන් සිර කඳවුරේ සිටින රට සුදු ඌරන් සහ ඌරු පැටව් 1973. 08. 20 වෙනි දින පෙරවරු 10 ට එම ස්ථානයේ දී වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙමි. මෙම ඌරන් ලබාගත් වහාම ගෙනයායුතු බවත්, සතියේ දිනවල කාර්යාල වේලා වේදී කෝපායි එළිමහන් සිර කඳවුර වෙත පැමිණ මෙම ඌරන් බැලීමට හැකිවන බවත් මෙයින් දැනුම් දෙමි.

කේ. තාගරාජා,
බන්ධනාගාර අධිකාරි.

73. 07. 11 වෙනි දින,
යාපනය බන්ධනාගාරයේ දිය.

7-1004 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

ප්‍රධාන මහේස්ත්‍රාත් උසාවිය—කොළඹ

මෙම උසාවියේ නඩු වලට ඉදිරිපත් කළ අයිතිකරුවන් විසින් ඉවත් කර ගෙන නැති සහ රාජසන්තක කරන ලද භාණ්ඩ තොගයක් 1973 අගෝස්තු 18 වෙනි දින පස්වරු 12.30 ට උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මහජනයාට මෙයින් දැනුම් දෙමි.

එදින දහවල් 12 සිට එම භාණ්ඩ බලා ගැනීමට ඉඩ සලසනු ලැබේ. විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පළකරනු ඇත.

ඩී. ඊ. ඩී. ද අල්විස්,
ප්‍රධාන මහේස්ත්‍රාත්.

1973 ජූලි මස 16 වන දින,
කොළඹ, ප්‍රධාන මහේස්ත්‍රාත් උසාවියේ දීය.

7-986 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**වෙන්දේසියේ විකිණීමයි**

**කොළඹ මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගේ ශාඛාව**

පහත සඳහන් භාණ්ඩ 1973 අගෝස්තු මස 3 වෙනි සිකුරාදා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන අතර වෙන්දේසිය පෙරවරු 9 ට ආරම්භ වේ. 1973 අගෝස්තු මස 1 වෙනි බදාදා පෙරවරු 9.30 සිට පස්වරු 1 දක්වා තැපැල් තක්සේරුකරුගේ කාර්යාලයේ දී භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

2. රේගු අයකැමිගේ හෝ ඔහුගේ සහායකයින්ගෙන් කෙනෙකු ගේ අනුමැතියට යටත්ව සහ තමයි මිත් මතු සපයා ඇති අවලංගු කිරීමේ අයිතියට යටත්ව, සාමාන්‍යයෙන් වැඩිම ඉල්ලුම්කරු ගැණුම් කරු වේ. ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතර ඇති වන කිසියම් මත භේදයකදී වෙන්දේසිය පවත්වන නිලධාරියාගේ තීරණය අවසාන තීරණය වේ.

3. හේතු ඉදිරිපත් නොකර ඕනෑම පුද්ගලයෙකුගේ හෝ පුද්ගල යින්ගේ හෝ ලන්සුවක් පිළිගැනීම ප්‍රතික්ෂෙප කිරීමට වෙන්දේසිය පවත්වන නිලධාරියාට සහ අයකැමිට පුළුවන.

4. ලන්සුවක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ භාණ්ඩ රේගු භූමියෙන් ඉවත්කර ගැනීමට පෙර ඕනෑම වේලාවකදී වෙන්දේසියක් අවලංගු කිරීමේ තනි අයිතිය අයකැමි වෙත තබා ගනී.

5. වෙන්දේසිය අවසානයේදී පිළිගන්නා ලද ලන්සුවේ වටිනා කම සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු භාණ්ඩ භාරදීම කරනු ලැබේ.

6. මිලදී ගන්නා භාණ්ඩවල තත්ත්වය සහ ඒවායේ අඩංගු ප්‍රමාණ සම්බන්ධයෙන් ගැණුම්කරු තමාම සැහීමට පත්විය යුතු අතර, එකී භාණ්ඩවල ගුනය, ප්‍රමාණය හෝ තත්ත්වය හෝ භාණ්ඩවල මාතෘමිකා නාමය පිළිබඳව අයකැමි සහතික නොකරයි. ඉදිරිපත් කර ඇති කොන්දේසි පිළිගෙන ඇත්නම් හැර කිසිම හේතුවක් නිසා ගැනුම් මිල අඩුකිරීමකට ගැණුම්කරුට හිමි කමක් නොලැබේ.

7. භාණ්ඩ පිළිබඳ විස්තර වල ඕනෑම වැරද්දක් හෝ අත්හැරී මක් වියහැකි අතර, එවැනි වැරදි හෝ අත්හැරීම් හෝ කිසිම විධිය කින් අවහිරයක් හෝ වෙන්දේසියට බලපෑමක් නොවිය යුතු මෙන්ම, ඒ වෙනුවෙන් කිසිම වන්දි ගෙවීමක් අනුමත නොකරන අතර, ලන්සු ලියා පදිංචි කිරීමෙන් පසු අනාවරණය වන අඩුවීම් පිළිබඳව කිසිම මිල අඩුකිරීමක් නොකරන අතර, සහ ලන්සු තැබීම ට ප්‍රථම හැම කරුණක් පිළිබඳව මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නන් තම තමාම සැහීමට පත්වී සිටි යයි බලාපොරොත්තු වනු ලැබේ.

8. කොළඹ 1, මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගෙන් වැඩි විස්තර ලබා ගත හකිය.

9. විවිධ ඉංග්‍රීසි කර්තෘන් විසින් ලියන ලද නවකතා. කෙටිකතා යනාදිය සියයේ කොටස් වශයෙන් වෙන්දේසියේ විකුණන අතර එක් එක් කතෘගේ හෝ එක් එක් විෂයයට හෝ අයත් පොත් මෙපමණ ප්‍රමාණයක් එම සියයේ කොටස් වලට ඇතුළත් යයි කිව නොහැකිය.

සමහරක් පොත්වල මාතෘකා හා කතෘන්ගේ නම් පහත පළවේ.

1. "ඈස් ද නේකඩ් වින්ඩ් ෆ්‍රොම් ද සී"—ගස්ටාප් සැන්ඩ්ග්‍රන්
2. "ඉන් සර්ච් ඔෆ් ග්‍රෙගරි" බොනි ගෙලසිව්ලි.
3. "මචෝ කැලහන්"—ජෝ මිලාර්ඩ්
4. "සලිවන්ස්"—පසල් බුක්ස්.
5. "නික් කාර්ටර්ගේ පොත්."
6. "අයි ලයික් ඉට් දට් වේ"—සාට්වන් ජෝන්.
7. "ද මාස්ටර් ඔෆ් බ්ලැක් ටවර්"—බාර්බරා මයිකල්ස්.
8. "රේජින් මූන්"—පීටර් මාර්ෂල්.
9. "ද වර්ල්ඩ් ඔෆ් මොඩලින්ග්"—ලූසී ක්ලේටන්.
10. "හේලීන්"—ටොල්බට් මූන්ඩි. යනාදිය.

ඊ. දුරෙසිරත්නම්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

තැත/73/විකිණීම්—2,
තැපැල් තක්සේරු අංශය,
මහ තැපැල් හල,
කොළඹ.

7-853 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

1973 අගෝස්තු 21, 22, 23 සහ 24 යන දිනයන්හි දිනපතා උදේ 9 ට පටන් ගෙන කොටස් 178 කින් යුත් ට්‍රැක්ටර් සහ වාහන වයර්ද, කොටස් 57 කින් යුත් බලවේග ස්ප්‍රේ යන්ත්‍ර, අත් ස්ප්‍රේ යන්ත්‍ර, බැටරි, බෝට්ටු, ඇන්ජින්, ආවුද සහ අනිකුත් අප්‍රයෝජනවත් භාණ්ඩ නාරාහේන්පිට නාවලපාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. 18.8.73 හා 20.8.73 දිනවල භාණ්ඩ පරීක්ෂාකර විස්තර ලැයිස්තුව ලබා ගත හැක.

2. වෙන්දේසියෙන් පසු ගැණුම් කරුවන් විසින් නියමිත මුදල් ප්‍රමාණයන් ගෙවා වහාම භාණ්ඩ ඉවත් කර ගෙන යායුතුයි.

3. වෙන්දේසිය අවලංගු කිරීම හෝ කල් දැමීමට කෘෂිකර්ම ඉංජිනේරුට බලය තිබේ.

ඇස්. පාස්කරන්,
කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්),
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

වැඩපල හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
නාවලපාර, නාරාහේන්පිට,
කොළඹ 5, 1973.7.12.

7-866 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ බෝගොඩ කෝරළයේ දඹුගල ගම කිරින්ද සුන්දරසෙවනෙහි පදිංචි වණසූරිය මුදියන්සේලාගේ පියදාස වන මම ඉදිරියේදී පවත්වනු ලබන සිංහල නොතාරිස් අවසාන විභාගයට ඉදිරිපත් වීම සඳහා අයදුම්පතක් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත ඉදිරිපත් කරන බව මෙයින් දන්වමි.

මෙයට,
ඩබ්ලිව්. ඇම්. පියදාස,
ප්‍රතිඥාත ලිපිකරු,

1973 ජූලි 16 වන දින.

7-911 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

මලල්පොල, පොලටගම පදිංචි රන්කොත්ගේ ජස්ටින් කරුණාසේන වික්‍රමසූරිය වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ආර්. ජේ. කේ. වික්‍රමසූරිය.

පොලටගම,
මලල්පොල.
1973. 7. 16

7-918—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

ඇල්පිටියේ අඟලගල්ලේ පදිංචි තොටගමුවගේ මිගෙල් ප්‍රනාන්දු වන මම නොතාරිස් ආඥාපනතේ 7 වගන්තියේ ප්‍රකාර මෙවක් සිට පුරා මාස එකක් ගතවූ පසු නොතාරිස්වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහාද යථාකාලයේ දී ගාලු දිස්ත්‍රික්කේ සිංහල භාෂාවෙන් වැඩ කරන නොතාරිස් කෙනෙකු ලෙස ඇතුළත් කරගනු ලැබීම සඳහාද රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

මීට,
ටී. එම්. ප්‍රනාන්දු,

1973.7.12.

7-939 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට ප්‍රථම කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි**

ලෝලුවාගොඩ පදිංචි දන්තොරු පතිරන්නැහෙලාගේ ගුණරත්න වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

ඩී. පී. ගුණරත්න.

ලෝලුවාගොඩ,
මීරිගම,
1973 ජූලි 11.

7-940 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුකූල දැන්වීමයි**

ශ්‍රී ලංකා ද්වීපයේ මධ්‍යම පළාතේ මහනුවර දිසාවේ අලවතුගොඩ ඇල්ලේකඩේ "මහින්ද සෙවනේ" පදිංචි මැදගම ගෙදර නොහොත් මහින්ද ගනේගොඩ ගුණපාල වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ත්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වන පරිච්ඡේදයේ 7 වන වගන්තියේ පළමුවන උපලේඛනයේ "ආ" කොටසේ දෙවන නියෝගය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ඇම්. ජී. ගුණපාල.

වර්ෂ 1973 ක්වූ ජූලි මස 09 වෙනි දින දීය.

7-938 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කෑගල්ලේ, මීපිටියේ "නිල්මිණි" හි පදිංචි වීරකීර්ති ගාමිණී කුමාර ආයසීරත්න වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ඩබ්ලිව්. ජී. කේ. ආයසීරත්න.

"නිල්මිණි"
මීපිටිය,
කෑගල්ල,
1973. 07. 16.

7-919 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ යක්විල තැපැල් වූ ඊරියගොල්ලේ පදිංචි හේරත් මුදියන්සේලාගේ විමලසේන හේරත් වන මම සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහාත් යලි නොතාරිස් කෙනෙකු හැටියට පත්කරගනු ලැබීම සඳහාත් ඇයැදුම් පතක් රෙජිස්ට්‍රාර් ජෙනරාල් තුමා වෙත ඉදිරිපත් කරන බව නොතාරිස් ආඥා පණතේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

එච්. එම්. ඩබ්. හේරත්,
ප්‍රතිඥත ලිපිකරු.

1973 ජූලි මස 13 වෙනි දින දී ය.

7-920 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අලුත්කුරු කෝරළේ මීගමුවේ පදිංචි වීරසිංහපතිරගේ සිමියොන් අප්පුහාමි වන මම මීගමු අධිකරණ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥා පණතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ඩබ්ලිව්. සිමියොන් අප්පුහාමි.

38/1, ආවෙමරියා පාර,
මීගමුව,
1973.7.13.

7-921 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් කරනු ලැබීම සඳහා ඉල්ලීමයි**

ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළේ බෙන්තොට දෝපේ පදිංචි කකත්තෙ කන්කානම්ගේ අබේසිරි නමැති මම අද සිට පුරා මාසයක් ගතවූ පසු ගාලු දිස්ත්‍රික්කයේ (බලපිටි අධිකරණ කොට්ඨාශයේ) සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් කරනු ලැබීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව (වර්ෂ 1907 අංක 1 දරණ ආඥාපනතේ 107 වැනි අධිකාරයේ) 7 වැනි වගන්තිය යටතේ 1 වැනි උපලේඛනයේ "ආ" කොටසේ 2 වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඟක්. කේ. අබේසිරි.

දෝපේ, බෙන්තොට,
1973 ජූලි 13.

7-922 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් කරනු ලැබීම සඳහා ඉල්ලීමයි**

ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළේ පහළගම් හයට අයිති හබුරුගල මහවිල පදිංචි ජයමාන්න සැමී නමැති මම මෙදින සිට පුරා මාසයක් ගතවූ පසු ගාලු දිස්ත්‍රික්කයේ බලපිටි අධිකරණ කොට්ඨාශයෙහි සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් කරනු ලැබීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව වර්ෂ 1907 අංක 1 දරන නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරියේ) 7 වැනි වගන්තිය යටතේ වූ පළමුවැනි උපලේඛනයේ "ආ" කොටසේ 2 ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

1973. 07. 16,
එස්. ජයමාන්න.

මහවිල,
හබුරුගල.

7-942 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ප්‍රසිද්ධ වෙන්දේසියක්**

පිටිගල හිඹුටුගොඩ පදිංචි මාපලගම රදගේ එඩ්‍රෝරිස්, පැමිණිලිකාරයා.

එදිරිව

පිටිගල හිඹුටුගොඩ පදිංචි කැප්පිටිගොඩ රදගේ කරෝලිස් ..........................විත්තිකාරයා.

බලපිටියේ දිස්ත්‍රික් උසාවියේ අංක ඇම්. බී. 991 දරණ නඩුවෙන් මා වෙත නිකුත් කරන ලද විකිණීමේ බලපත්‍රය යටතේ ඉහතකී විත්තිකාරයාගෙන් අයවිය යුතු මුදල වන රු. 2,000 ද, ඊට 1970.11.16 වෙනි දින සිට ගෙවන දිනය දක්වා සියයේට පනේ පොලිය සහ නඩු ගාස්තුව වන රු. 287.20 ද අයකර ගැනීම පිණිස මෙහි පහත සඳහන් දේපල වර්ෂ 1973 ක්වූ සැප්තැම්බර් මස 4 වෙනි අඟහරුවාදා උදය 10.30 ට පටන්ගෙන ම විසින් එහිදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එනම් :—ගාළු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළේ හිඹුටුගොඩ පිහිටි බෙදූ වෙන්කල පිතලවල පොල්ලෑව්ව නම් වූ උතුරෙන් අංක T.P. 154339 සහ 154340 දරණ ඉඩම්ද, නැගෙනහිරින් අංක T.P. 154340 සහ 154343 දරණ ඉඩම්ද, දකුණෙන් අංක T.P. 154343 සහ 154344 දරණ ඉඩම් සහ බස්නාහිරින් අංක T.P. 154344 සහ 154339 දරණ ඉඩම්ද යන මායිම් තුල අක්කර දෙකකුත් පාර්චස් දහහතක් විශාල ඉඩමේ බිමෙන් සහ බිමට හිමි ගහ කොල ආදියෙන්ද නොබෙදූ දෙකෙන් (½) පංගුව වේ.

පී. ඩබ්ලිව්. රිචර්ඩ් ද සිල්වා,
වෙන්දේසිකාර කොමසාරිස්.

වතුගෙදර,
කුරුඳුවත්තේ දීය.

7-1014 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය

නිවේදන අංක : 406/413/73/1

### බතික් රෙදි මුද්‍රණය සඳහා ඉල්ලුම් පත්‍ර

මුද්‍රණය කිරීම සඳහා රෙදිද, සායම් සහ රසායන ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා විදේශ විනිමයද සීමාසර ඇති නිසා 1973 සැප්තැම්බර් මස 30 වන දිනට පසු බතික් රෙදි මුද්‍රණය කිරීමේ ආයතන ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර භාර නොගන්නා බව සාමාන්‍ය දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර සලකා බැලීමේදී බතික් රෙදි මුද්‍රණය කිරීම පිළිබඳව පළපුරුද්දක් සහ පුහුණුවක් ලබා ඇති පුද්ගලයන් කෙරෙහි අවධානය දක්වනු ලැබේ.

කොළඹ 2, ශ්‍රී ජිනරතන පාරේ අංක 48හි කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ වැඩ සටහන් සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අංශයෙන් ලබා ගත හැකි නියමිත ආකෘතිවල තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන මෙන් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නන්ගෙන් ඉල්ලනු ලැබේ.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය යම් උපදෙස් සහ මාර්ගෝපදේශ සඳහා කොළඹ 7, ගිරිගෝරිස් පාරේ අංක 16හි, කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් විමසිය හැක.

නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර බහාලූ කවරයෙහි "බතික් රෙදි මුද්‍රණය සඳහා ඉල්ලුම් පත්‍ර" යනුවෙන් සඳහන් කොට 1973 සැප්තැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඒ. වීරරත්න මහතාට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඒ. වීරරත්න,
අතිරේක ලේකම්,
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය.

7-961 —73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම **දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.**

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.27 | බදාදා | දවල් 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.04 | බදාදා | දවල් 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.11 | බදාදා | දවල් 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදාදා | දවල් 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් 12.00 |
| | 73.08.31 | සිකුරාද | .. | 73.08.22 | බදාදා | දවල් 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් 12.00 |
| | 73 09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | අඟහරුවාද | දවල් 12.00 |
| | 73.09 28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.